www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ජෝන් මැකේන් මුනිවර තත්වයට නැංවීම; මාධ්‍ය හා දේශපාලන සංස්ථාපිතය
# යුද පිපාසිතයා ශාන්තුවරයෙකු බවට හරවයි

The canonization of John McCain: Media, political establishment turn warmonger into saint

**2018 සැප්තැම්බර් 1**

*"ඔවුන් මාව අල්ලා සිරකර තැබීමට පෙර පවා, මම මගේ සතුරන්ට වෛර කලෙමි. ඒ මන්ද යත් මා අතින් කෙරෙන්නට නියමව තිබුනු ඝාතනයෙන් මා පැකිල වූ ගුනවත් මානුෂික ආවේගය යටගසා ගෙන, ඔවුන් මුලමනින්ම වනසා දැමීමට කැපවීම සඳහා, මා තුල පැසවූ වෛරය ආධාර වූ වූ හෙයිනි."* ජොන් මැකේන්, 2001 අප්‍රේල්, වියට්නාම් යුද්ධය ගැන.

*"අවි ගැනීමට කරන කැඳවුමක ආවේගය කෙතරම් වුවද, යුද අරමුන කෙතරම් යුක්ති සහගත වුව ද යුද්ධය අපෙන් ශාස්තුව අය කරගන්නා කල්හි, අප ට නැතිවී යන දෙය ගැන කඳුලක් හෙලන්නට අපට සිදුවනු නියත ය. කඳුලක් හෙලන්න, ඉන් පසු හැකිතාක් ඉක්මනින් හා හැකිතරම් කුරිරු ආකාරයට අපගේ සතුරන් මරාදැමීමේ කාරියට බැසගන්න."* ජෝන් මැකෙන් 2001 ඔක්තෝබර්.

ඇමරිකානු මාධ්‍ය සහ දේශපාලන සංස්ථාපිතය රිපබ්ලිකානු සෙනේට් මන්ත්‍රී ජොන් මැකෙන් ගේ මරනය වටා දින පහක සදාචාර කුහකත්වයක, වචාලයක හා මිත්‍යාවන් ගෙතිල්ලක යෙදී සිටී. එම මෙහෙයුමට හැම ප්‍රවෘත්ති ධාරාවකම, ප්‍රවෘත්ති පත්‍ර ප්‍රකාශනයක්ම, සහ ඩිමොක්‍රටික හා රිපබ්ලිකානු දේශපාලකයෙක්ම හවුල්වූ, ජෝන් මැක්කෙන්, 'ඇමරකානු වීරයා' , 'රනවිරුවා' ලොව කවරකලෙකවත් යලි දකින්නට නොලැබෙනු ඇති අසමසමයා, යන පොදු රචනයක් සපයා ඇත. එය සකසා ගැනීම අරඹන ලද්දේ අවුරුද්දකටත් වැඩි කාලයකට පෙර මැකෙන් මොලේ පිලිකාවකින් රෝගීව ඉන්න බව චිකිත්සාවකින් නිගමනය කරගත් වහා මය.

බ්‍රහස්පතින්දා, හිටපු උප ජනාධිපති ජෝ බිඩන් සහ තවත් අයගේ කථා වලින් සමන්විත උත්සවයක් ෆ්‍රෑන්ක් සිනෙට්‍රාගේ 'මයි වේ' නම් ගීතයෙන් හමාර විය. එතැන් සිට මැකේන්ගේ දේහය මිලිටරි හෙලිකොප්ටරයකින් වොෂින්ටනයට ගෙන යන ලදී. එය 31දා ප්‍රාන්තයේ කැපිටොල් ගොඩනැගිල්ලේ රොටුන්ඩාහි තැන්පත්කර තිබුනි. ඒ ගෞරවය ලැබ් තිබුනේ තවත් අය 30 දෙනෙකුට පමනි.

මැකෙන් ගේ පෙට්ටිය තැන්පත් කෙරුනේ, 1865 දී ඝාතනය කෙරුනු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් ගේ පෙට්ටිය සඳහා මුලින් තනන ලද ලී වේදිකාව උඩ ය. මෙය එතන සිදුකෙරුනු දේශපාලන කුපාඩිකම් ගනනාවෙන් එකකි.

30දා වෙන් කෙරුනේ රැස්ව සිටි කොන්ග්‍රස් මන්ත්‍රීන්ගේ, දේශපාලකයන්ගේ හා මිලිටරි නිලධාරීන්ගේ කතා වලට ය. මැකේන් "පරම්පරාගත නායකයෙකි" සෙනේට් සභාවේ රිපබ්ලිකන් නායක මිච් මැක්කොනෙල් පැවසීය. "අපගේ ජාතිය කවදා හෝ බිහිකල නිර්භීතම ආත්මයන්ගෙන් එකකි." කොන්ග්‍රස් කථානායක පෝල් රයන් පැවසීය. "අද දින අනුස්මරන උත්සවයේදී ගෞරවාචාර දක්වන අය අතර හිටපු ජනාධිපතිවරුන් වන බරක් ඔබාමා හා ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ද හිටපු රාජ්‍යලේකම් හා යුද අපරාධකාරයෙකු වන හෙන්රි කිසිංජර් හා තවත් අය වෙති. පසුව මැකේන්ගේ දේහය 2දා, මේරිලන්ඩ් ප්‍රාන්තයේ ඇනාපොලිස්හි නාවික ඇකඩමියේදී වල දමනු ඇත.

අවසානයේ දෙනට උරදෙන්නවුන් අතර, ඩිමොක්‍රටික් ආධාරකරුවෙකු ද මැකෙන්ගේ මිත්‍රයා ද වන වොරන් බිට් නලුවා ද හිටපු ආරක්ෂක ලේකම් විලියම් කොහෙන් ද පුටින් විරෝධී රුසියානු විපාක්ෂික ව්ලදිමීර් කාරා මුසා ද වෙති.

බ්‍රහස්පතින්දා බිඩන් කල කතාව පසුව සිදුවූ දේ වලට තානම සැපයීය. මැකේන් "සහෝදරයෙක්" ය යි බිඩන් කීය. අප අත ර "බොහෝ පවුල් දබර තිබුනු නමුත් අප අතර පැවති බොහෝ පොදුදේවලින් වෙනස් කම් යටපත් කරගත හැකිව තිබින. 2008 ජනපති වරනයේ දී මැක්කෙන් පැරදවූ ඔබාමාගේ උප-ජනාධිපති අපේක්ෂකයා වූ බිඩන් මෙහිදී ප්‍රතිරාවය කලේ, ජනපති වරනය හුදෙක් "ගෙදර තුල ම සන්ඩුවකට නොවැඩි දෙයක් ය"යි කියාසිටි ඔබාමාගේ වචන මයි.

ජෝන් ගේ කතාව ඇමරිකානු කතන්දරයක් බව කියා සිටි බිඩන් මෙසේ පැවසීය: "එය ඇමරිකාවේ වෘත්තාන්තය යි. ගෞරවය සහ යහබව, මූලික සාධාරනත්වය සහ බලය අවභාවිතය නොඉවසීම. ලෝකය පුරා ඇවිදින ඔබ බොහෝ දෙනා, ලෝකයේ සෙසු අය අප ගැන සිතන සැටි බලන්න. ඔවුහු අප දෙස බලන්නේ තරමක අව්‍යාජ ආකාරයකින්, බොහෝ සාධාරන ලෙස, බොහෝ විනීත ලෙසය. අපි අව්‍යාජ ඇමරිකානුවන් වන්නෙමු. ඒ අපය. ඒ ජෝන්ය."

එවන් කුනුහරුප ගැන යමෙක් කියනු ඇත්තේ කුමක් ද? ඇමරිකානු ආන්ඩුව හා එහි මිලිටරිය ලොව වටා මැදිහත් වෙමින් නිමක් නැති රටවල ඝාතන හා විනාශයන් ඇති කිරීමට වගකිව යුතුය. ඇෆ්ගනිස්ථානය, ඉරාකය, ලිබියාව සිරියාව යේමනය පලස්තීනය හා තවත් බොහොමයක් තැන්වල. මෙම "විනීත" ආන්ඩුව සිය මාවත හරහට සිටින ඕනෑම අයෙක් මරා දැමීම, ඕනෑම රටක් ආක්‍රමනය කිරීම, ඕනෑම ආන්ඩුවක් පෙරලා දැමීමේ අයිතිය ප්‍රකාශ කරයි. මේ "ඉතා සාධාරන" පාලක පන්තියේ චර්යාව වන්නේ, අඩන්තේට්ටම් කිරීම, බියවැද්දීම, තර්ජන හා ප්‍රචන්ඩත්වයයි.

මැකේන් වඩාත් සම්පව බැඳී සිටියේ ඉවබව නැතිව මිලිටරි බලය යොදාගැනීම සමගය. 2003 ඉරාක යුද්ධය, ඔබාමා පාලනයේ ලිබියාවට එරෙහි යුද්ධය හා සීඅයිඒ පිටුබලය ලත් සිරියාවේ මෙහෙයුම් වලට කලින්ම සහාය දුන් වඩාත්ම යුදවාදී කොටස් අතර ඔහු විය. සිරියානු කුමන්ත්‍රන වලට සහායදීමේදී ඔහු කුප්‍රකට ලෙස එරටට ගොස්, සිවිල් යුද්ධය ඇවිලවීමේ නිරත ඉස්ලාමීය මූලධර්මවාදී සංවිධාන මුන ගැසුනේය. ඔහු ඉරානයට එරෙහි ආක්‍රමනකාරීත්වය වෙනුවෙන් දැඩි ලෙස පෙනී සිටි අතර දැවැන්ත මිලිටරි අයවැය මත

කිසිදු සීමාවක් පැනවීමට තදින්ම විරුද්ධව සිටි අයෙකි.

මැකේන්ගේ මරනයට ප්‍රතිචාර වශයෙන් සම්බන්ධීකාරක හා නාටකාකාර රඟදැක්වීම් තීරනය වුනේ නිශ්චිත දේශපාලන ගනන් බැලීම් මතය. පලමුවෙන්ම පාලක පන්තිය අතර කන්ඩායම්ක ගැටුමක් පවතී. එහිදී මිලිටරි ඔත්තු සේවා සංස්ථාපිතයේ අධිකාරවත් කොටස්, ට්‍රම්ප් ආන්ඩුවට එරෙහිව පෙල ගැස්වීමයි. මැකේන්, රුසියානු විරෝධී උද්ඝෝෂනයේදී, ඩිමොක්‍රටික් පක්ෂය සමග සන්ධානය වෙනුවෙන් ප්‍රමුඛ භූමිකාවක් ඉටු කලේය. එය ඉලක්ක කලේ, සිරියාව තුල රුසියාවට එරෙහිව වඩාත් ආක්‍රමනකාරී විදෙස් පිලිවෙතක් ක්‍රියාවට නැගීමය. වාර්තා වුන පරිදි මාස ගනනක් තිස්සේ මෙලොවින් ඔහුගේ අවසන් සමුගැනීම සඳහා මැකේන්ගේ සවිස්තරාත්මක උපදෙස් අතර, ඊට ට්‍රම්ප් සම්බන්ධ කර නොගැනීම ද ඇතුලත් විය. ඒවා  මාධ්‍ය තුල ප්‍රචාරය කෙරුනි.

බිඩෙන්ගේ සිට ඔබාමා දක්වාත්, බර්නි සැන්ඩර්ස් හා ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාසියෝ කෝටිස් වැනි ඩිමොක්‍රටික් " වාම" නියෝජිතයින් ද සිය ජීවිත කාලය පුරාම මිලිටරිය සමග සමීප බැඳීම් සහිතව සිටි අයෙක් සමග පෙලග ැසීම පිනිස මේ අවස්ථාව ඩැහැ ගත්හ. මෙම ප්‍රචන්ඩත්වයේ පර්යායට සිය භක්තිය පල කිරීමට සෑම විටම උනන්දුවන්නාවූ ඩිමොක්‍රටිකයෝ, හිටපු සීඅයිඒ අධ්‍යක්ෂ ජොන් බ්‍රෙනන් ද සමග මැකේන් ද සිය දේශපාලන දේව සභාවට ඔසවාගෙන ගියේ, හැකි දක්ෂිනාංශිකම පදනමකින් ට්‍රම්ප් කෙරෙහි සිය විරුද්ධත්වය පලකිරීමේ හොඳම ක්‍රමය ලෙසය.

වඩාත් මූලිකව, මැකේන්ගේ මලගමට පලවූ ප්‍රතිචාරය, වියට්නාම් යුද්ධය පුනස්ථාපනය කිරීමේ තවත් සැතපුම් කනුවක් විය. රේගන් පාලනයේ මුල් දිනවල සිටම "වියට්නාම් රෝග ලක්ෂන" එනම් මිලිටරි මැදිහත්වීම් කෙරෙහි වන ජනතා විරෝධය ජයගැනීම, පාලක පන්තියේ දේශපාලන අවශ්‍යතාවක්ව පැවතුනි. 1991 පලමු ඉරාක යුද්ධය අවසානයේ එවක ජනාධිපති ජෝර්ජ් බුෂ් (ජ්‍යෙෂ්ඨ) අපරිනත ආකාරයෙන් පැවසුවේ, "දෙවියනේ, අපි වියට්නාම් වසංගතයට පා පහරදී, සදහටම අවසන් කලෙමු."

නොනවතින හා නිමක් නැති යුද්ධය යුක්ති යුක්ත කිරීමේ නව දේශපාලන මනෝවිද්‍යාවක් වර්ධනය කිරීමේ උත්සාහයේදී ඉතිහාසය මුසාකරනය අවශ්‍ය කෙරේ. වියට්නාමය තුල මැකේන්ගේ "රනශූරත්වය" ට සියලු ස්තෝත්‍ර ගැයීම් තුල, වියට්නාම්වරු මිලියන තුනකගේ ද ඇමරිකානු සෙබලුන් 6 0000ගේද දිවි සුන්කල තිරස්චීන අධිරාජ්‍යවාදී මැදිහත්වීමෙන් සිදු කල යුද්ධයේ ස්වභාවය ගැන විවේචනාත්මක අදහස් පල කිරීමක අංශු මාත්‍රයක්වත් නොවීය. 1961-1971 අතර දශකයක් තුල ඇමරිකානු මිලිටරිය, නිමක් නැති කුරිරුකම්වල යෙදී ඇති අතර, විස රසායනික ගැලුම් මිලියන 20ට වඩා ඉන්දු චීනයට හෙලා ඇත. එමගින් වියට්නාමයෙන් තුනෙන් එකක් මුඩු බිමක් බවට පත් විය.

මැකේන් 2001 වසරේදී යුද්ධයේ ස්වභාවය ගැන සිය අත්දැකීම් පලකිරීමේ දී වඩා සත්‍යවාදී විය. ලිපියේ මුලට සඳහන්වන පලමු උපුටා දැක්වීම, ඒ වසරේ අප්‍රේල් මාසයේදී ලියන ලදී. හිටපු සෙනේට් සභික බොබ් කෙරී, තමන් සහ තමා යටතේ සිටි සෙබලු හය දෙනෙකු විසින්, මීකොං ඩෙල්ටාවේ පැහිටි තාන් පොං යන ගමේ කාන්තාවන්, ලමුන් හා වයෝවෘද්ධයන් 21 දෙනෙකු  ඝාතනය කල බව පිලිගැනීමෙන් පසුව ඔහු ආරක්ෂා කරමින් ඒවා ලියා තිබුනි.

"බොබ් කෙරී, රන විරුවා" යන සිරස්තලය සහිතව මැකේන් ඔහු ආරක්ෂා කිරීම, යුද අපරාධ සඳහා පිදූ සායම් නොගැල්වූ යුක්තිකරනයකි. මැකේන් වියට්නාමය සමග සංහිඳියාව ද එරට සමග යහපත් සබඳතා ද වෙනුවෙන් කැමති වුනේ, චීනය සමග ඇමරිකානු ගැටුම නිසා ය යන කාරනයෙන් බොහෝ දේ කියවේ. එහෙත් ඔහුගේ ප්‍රකාශයන්ගෙ න් යුද්ධය තුල ඇමරිකාවේ භූමිකාව ගැන කම්පාවන කිසිවක් පල නොවේ. ඒ වසරේම "ජයග්‍රහනය සඳහා කිසිදු විකල්පයක් ඇත්තේ නැත" යන සිරස්තලය යටතේ, මැකේන් විසින් *වෝල්ස්ට්‍රීට් ජර්නලයට* ලියන ලද තීරුවකින් උපුටා ගත් ඉහත සඳහන් දෙවැන්න,  වියට්නාමය තුල ක්‍රමානුකූලව සිදුකරන ලද මිලේච්ඡ හා ප්‍රචන්ඩ ක්‍රියා, "21 වන සියවසේ යුද්ධ" සඳහා මොඩලයක් ලෙස ඔහු දැකගත් බව පැහැදිලි කරයි.

"වියට්නාම් රෝගයේ ලක්ෂන" අවසානයකට ගෙන ඒමේ උත්සාහය, ඉතිහාසය විකෘති කිරීමක් පමනක් නොව ගැබ්කර ගන්නේ, රටේ දේශපාලන ජීවිතය තුල මිලිටරියේ තැන නඟාසිටුවීමක් ද වේ. මැකේන් මිලිටරි රාජ්‍යයේ මිනිසා,' රන විරුවා' ලෙසින් හඳුන්වා දීම, මෙහි කොටසකි. 1990 ගනන් වන තෙක් සෙබලුන්' රනවිරුවන්' ලෙස හැඳින්වුනේ නැත. පලමුවන හා දෙවන ලෝක යුද්ධයේ නිපුනයින්, කොරියාව ගැන නොකීවත්, යුද්ධය තුල සිය අත්දැකීම් ගැන කථා කිරීමට කැමැත්තක් නොදැක්වීය. නිසැකවම ඔවුන්ට මිලිටරි යුනිෆෝමයෙන් සැරසීමට ද අවශ්‍ය නොවීය.

අද දිනයේ මිලිටරිය හා ඔත්තු සේවා, කවර කලෙකවත් ඇමරිකානු ජීවිතය තුල ඉටු නොකල තරම් අධිකාරවත් ක්‍රියාකලාපයක් ඉටු කරති. මිලිටරිය මාධ්‍ය වැලඳගෙන සිටී. මාධ්‍ය මිලිටරිය වැලඳගෙන සිටී. රිපබ්ලිකානුවන්ටත් වැඩි නොවන්නේ නම් ඩිමොක්‍රටිකයෝ, තනතුරු දැරීමට තමන්ට ඇති වැඩිම සුදුසුකමක් ලෙස  පෙන්වන්නේ තම, මිලිටරි හා ඔත්තු සේවා පසුබිමයි. දැරිය නොහැකි මට්ටමේ සමාජ අසාමානතාව ද  කම්කරුවන්ගේ හා තරුනයින්ගේ දේශපාලනික රැඩිකලීකරනයේ බලපෑම ද හමුවේ, හා පාලක පන්තිය පැත්තෙන්, තම අධිරාජ්‍යවාදී දිග්විජය හා සමාජ ප්‍රති-විප්ලවය පිලිබඳ පිලිවෙත මහජන ප්‍රතිරෝධයට මුහුන දෙනු ඇති බවට පලවන ගැඹුරු හා අනිවාර්ය බිය හමුවේ මිලිටරිය ගැන විශ්ව ව්‍යාපී උත්කර්ෂයට නැංවීම ප්‍රකාශයට පත්වේ.

මැකේන් මුනිවරයෙකුගේ තත්වයට ඔසවා තැබීම ගැන අවසාන වශයෙන් කිව යුත්තේ, සමස්ත ක්‍රියාවලියම එහි පුහු බවෙන්, කෘතීම ස්වභාවයෙන්, අති බහුතරයක් ජනතාවගේ සිතුම් පැතුම් වලින් හා උත්සුකයන්ගෙන් හුදෙකලාවීම තුල ප්‍රකාශයක් ලබාගන්නා බවයි. මැකේන් දේශපාලනික හා සදාචාරමය යෝධයෙකුගේ මට්ටමට ඔසවා තැබීමට ඔවුන් කෙතරම් උතත්සාහ කල ද බොහෝදෙනා ඔහුගේ මරනය ගැන මොනම තැකීමක්වත් නොකරයි. මැකේන් දොරේ ඇති බෝලය මෙන්ම අප්‍රානිකය. ඔහු පිලිබඳ මතකය වේගයෙන් ජනතාවගේ මතකයෙන් ඉවත්ව යනු ඇත. ඔහුගේ මරනයේ පලමු වාර්ෂික අනුස්මරනය හා ඒ පිටුපස පෙලගැසෙන්නන් ගැන කිසිම අවධානයකින් තොරව පහව යනු ඇත.

ජෝසෆ් කිෂෝර්

© www.wsws.org